# 06
# පරිවර්තන ක්‍රියාවලිය

## පරිවර්තනය යනු මෙතෙක් පැවති දෙයක පූර්ණ වෙනස් වීම යි එනම්



## සැබෑ වෙනසක්

❖ **සාවුල් කිතුනුවන් පිළිබඳ ක්‍රියා කළ ආකාරය**

- ස්තේපන්ට ගල් ගැසීමේදී සාක්ෂිකාරයන්ගේ ඇඳුම් සාවුල් නම් යෞවනයාගේ පාද අබියස තබන ලදී. (ක්‍රියා 7 : 58 ) මෙහි දී ඔහු මරා දැමීම පිළිබඳ ව සාවුල්ගේ අනුමැතිය හා සතුට ප්‍රකාශ වේ. ( ක්‍රියා 8 : 1 )

- එසේ ම සැන්හෙඩ්‍රින් සභාව කිතුනුවන් විනිශ්චය කරන අවස්ථාවල දී ඔවුන්ට විරුද්ධ ව තම ඡන්දය භාවිත කළ බව කියැවේ.
(ක්‍රියා 26 : 16 )

- එරිසියකු ලෙස ටෝරාව ගැන දැන එයට විශ්වාසී ව කටයුතු කරමින් සභාවේ පුද්ගලයන් සොයා යමින් පීඩා කළේ ය. (ක්‍රියා 8 : 03 ) ජෙරුසලමේ පමණක් නොව පිට ද විසිර සිටින අය මරා දැමීමට බලපත්‍ර ලබා ගෙන කටයුතු කළේ ය.

මෙම පීඩා සමයෙහි ජෙරුසලම තුළ යේයුස් වහන්සේ මාර්ගය ඇදහුවන් මරා දැමූ නිසා ඔවුහු ආරක්ෂාව පතා දමස්කයට හා ජෙරුසලම නගරය අවට ප්‍රදේශයට පළා ගියහ. මෙහි දී ඔවුන් නිහඬ ව නොසිට ධර්මය ප්‍රකාශ කළ අතර ඒ අනුව ක්‍රිස්තුන් වහන්සේ පිළිගන්නන් ලොව පුරා පැතිර යාමට එය මුල් විය.

ක්‍රිස්තු අනුගාමිකයින්ට මුලින් ම ක්‍රිස්තියානි යන නාමය ලැබුණේ අන්තියෝකියේදී ය. ක්‍රියා 11 : 20

මෙහි දී සාවුල්ගේ විශේෂ දෙයක් ලෙස අප දකින්නේ එතුමා තමාගේ විශ්වාසය හා ඇදිහිල්ල මත කිතුනුවන්ට විරුද්ධව කළ මර්ධනය ව්‍යාපාරය පවා එඩිතර ව කැපවීමෙන් කළ බව ය.

## හැරීම ?

සාවුල්තුමාගේ හැරීම දමස්කයට යන අතර මඟ දී සිදු වූවක් ද?
නැත්නම් කාලයක් තිස්සේ ඔහුගේ සිත තුළ ගැටෙමින් තිබුණ ප්‍රශ්න රාශියක් සමඟ එම අත්දැකීම තුළ ස්ථිර නිගමනයකට එළඹීමක් ද ?

සාවුල්

| හැරීමට පෙර | හැරීමෙන් පසු |
|---|---|
| පීඩකයෙක්<br>තමන් පිළිබඳ තමන් විසින් තීරණ ගැනීම | පීඩා විඳින්නෙක්<br>දෙවියන් වහන්සේ මඟ පෙන්වීම යටතේ තීරණ ගැනීම |
| තමන්ගේ සුරක්ෂිත බව උදෙසා තීරණ ගැනීම | තමන්ගේ සුරක්ෂිත බව වෙනුවට අන් අය වෙනුවෙන් වැය වීම |

පුද්ගලයෙකුගේ ක්ෂණික හැරීම දිගුකාලීන පැවතීමක් බවට පත් නොවේ. එය හැඟීම අනුව කටයුතු කිරීමක් ද ? එසේ ම එම හැඟීම නිම වූ පසු  එම හැරීම ද නිමාවේ ද? ක්ෂණික වෙනස් වීම නැවත ක්ෂණික වෙනස් වීමකට භාජනය විය හැකි බව පෙන්වන අනතුරු හැඟවීමක් ද ?

නමුත් පාවුල් තුමාට මෙම වෙනස් වීම ක්ෂණික ව සිදුවීමක් නොවීමට ඉඩ ඇත. මන්ද පාවුල්ගේ හැරීම දිගුකාලීන අඛණ්ඩ පැවැත්මකින් පැවතුන බැවිනි.

**හැරීමේ ක්‍රියාවලිය තුළ සාවුල්ගේ දමස්කයට යන මඟ ඉතා වැදගත් ය. පුර්ණ යහපත් හැරීමකට පාදක වූ කරුණු රාශියකි.**

ස්තේපන් පිළිතුරු කථාව කරන අවස්ථාවේ ඔහු එතැන සිටියා විය යුතු ය. (ක්‍රියා 7: 58) ස්තෙපන්ගේ නිර්භීත මරණය හා ඔහුගේ සතුරාට පවා සමාව දෙන වදන් ......... සාවුල්ට බලපෑමක් කළා ද ?

නූගත් සාමාන්‍ය ජනතාවගේ (ධීවරයන්  සිමොන් පේදුරු ගගගග) නිර්භීත තර්කානුකූල කථා බහ (ක්‍රියා 4 : 13)


ගෝලයන්ගේ පුදුම ක්‍රියා  (ක්‍රියා 4 : 16)

මන්ත්‍රණ සභාව තුළ ගමාලියෙල් යන මධ්‍යස්ථ මතධාරියාගේ ගෝලයකු ලෙස ඔහුගේ අදහස් (ක්‍රියා 5 : 34  39) ඔහුට බලපෑවා නොවිය හැකි ද ?

**හැරීම ?**

"සාවුල් සාවුල් ඔබ මට පීඩා කරන්නේ මන්ද ?
කෙවිටට පයින් ගැසීම ඔබට අන්තරාදායකය".

දමස්කය :
ජුදෙව්වන් වාසය කළ විශාල ජනපදයකි. ( ක්‍රි:ව : 6670 දක්වා එහි සිටි ජුදෙව්වන් 18000 පමණ සමූල ඝාතනය කළ බව සඳහන් ය.) ජෙරුසලමෙන් පළා ගොස් දමස්කයේ ආරක්ෂාව පැතූ ජුදෙව් කිතු බැතියන් හිර භාරයට ගැනීම සාවුල්ගේ අරමුණ යි.



ක්‍රියා 9 : 1 9 ක්‍රියා 22 : 3 11 ක්‍රියා 26 : 9 19

බයිබල් කොටස් හොඳින් කිය වූ පසු ඔබට මෙම නාට්‍ය පිටපත් අනුව නාට්‍යයක් රඟ දැක්විය හැකි ය.

## I ජවනිකාව

(ජුදෙව් නිවසක සාලය පෙන්නුම් කරනු ලබයි. මේසයක්, පුටු කිහිපයක්, මල් පෝච්චියක් දැකිය හැකිය. තරුණ ජුදෙව්වකු හා මහලු ජුදෙව් කාන්තාවක් අතර සංවාදයක් දැකිය හැකි ය. )

සාවුල් : අම්මේ මම ටික දවසකට දමස්කයට යනවා. උත්තම පූජක තුමා දීපු අවසර ලිපි තමයි මේ.

මව : මොකක්ද පුතේ, ඇයි දමස්කයට යන්නේ ?

සාවුල් : අම්මේ, ක්‍රිස්තු මාර්ගය කියලා දෙයක් උගන්වන කට්ටියක් අපේ තෝරාවට විරුද්ධ දේ උගන්වනවා. එයට විරුද්ධ ව වැඩ කරනවා මම යන්නේ ඔවුන් අල්ලගෙන ජෙරුසලමට අරගෙන එන්න.

මව : ඒත් පුතේ, ඒගොල්ලෝ බය නැති ව දේශනා කරනවනේ.

සාවුල් : මටත් හරි පුදුමයි. අර ස්තේපන්, මම ළඟ හිටියේ, පුදුම වචන ටිකක්
මරණ අයටත් ඔහු සමාව දීලනේ.
දෙවියන් වහන්සේගෙනුත් සමාව ඉල්ලුවා ඔවුන් වෙනුවෙන්
මැරෙන්න බය වුනේම නෑ......... මට තාමත් මතක් වෙනවා.

මව : ඔව් පුතේ, නූගත් මිනිස්සු වුනාට කථාකරන බුද්ධිමත් තාර්කික විලාසය කියලා මිනිසුන් කථා කරනවා.

සාවුල් : ඔව් (මදක් කල්පනා කර සුසුම්ලා) ඒක වැඩක් නැහැ. මම හිතන හැටියට අපේ ධර්මයට විරුද්ධ ව තමයි ඔය වැඩ, මම එය කොහොම හරි නවත්වනවා. මම යනවා අම්මේ.

## II ජවනිකාව

( සාවුල් පිට වේ. මහා මාර්ගයක් පෙන්නුම් කරයි. සාවුල් හා පිරිස දමස්කය බලා පිටත් වෙති.)

සාවුල් : අම්මේ .......(ආලෝකයක් දැක බිම වැටේ අනෙක් අයට කිසිවක් පෙනෙන බවක් නොපෙනේ .)

හඬ : " සාවුල් සාවුල් ඔබ මට පීඩා කරන්නේ මන්ද? කෙවිටට පයින් ගැසීම අන්තරාදායකයි."

1 පුද්ගලයා : " ඔබ මට පීඩා කරන්නේ " ? ඒ මොකක් ද?

2 පුද්ගලයා : මම හිතන්නේ කිස්තු මාර්ගය පිළිගන්නන්ට පීඩා කිරීම, මොහුට පීඩා කිරීමක් කියලා වෙන්නැති මේ කියන්නේ. එතකොට මොහු කවුද?

1 පුද්ගලයා : මොකක් ද? මේ කෙවිටක කථාව. හෙබ්‍රෙව් බසින් නේද කිව්වේ?

2 පුද්ගලයා : ආ.......... ඒක ග්‍රීක ප්‍රස්ථා පිරුලක්........... නිශ්චල ව විරුද්ධතා ව දැක්වීම කියන එකයි එහි තේරුම.

1 පුද්ගලයා : හරි, තේරුණා. ඒ කියන්නේ ගවයා කෙවිටට පයින් ගැසීමේ ප්‍රතිඵලය තමාට ම තුවාල කර ගැනීමනේ.

සාවුල් : ස්වාමීනි ඔබ කවරෙක් ද?

1 පුද්ගලයා : " ස්වාමීනි " මොනවා ඔහු යටත් වෙලා වගේ. ඔහු පිළි අරගෙන ...... ඔහුත් ඒ මාර්ගයට හැරිල ද?

හඬ : " මම ඔබ පීඩා කරන ජේසුස්. නැගිට නුවරට ඇතුලුවන්න. ඔබ කළ යුතු දේ ඔබට කියනු ඇත."

1 පුද්ගලයා : (පුදුමයෙන්) ජේසුස්ලු..... අන්න ඔහුව කැඳවනවා ඒ මාර්ගෙ වැඩට.

2 පුද්ගලයා : හැරීමක් සිදු වන කොට දෙවියන් වහන්සේ ඔහුන්ගේ අනාගතය සැලසුම් කරනවා. හරියට ආබ්‍රහම් වගේනේ මොහු. මොනවා ද වෙන්නේ...... කොහේ ද? යන්නේ....... මුකුත් දන්නේ නෑ.

2 පුද්ගලයා : අන්න බලන්න කිසි දෙයක් පෙන්නේ නෑ වගෙ. අපි ඔහු ව අල්ලගෙන දමස්කයට ගෙන යමු.

1 පුද්ගලයා : ජීවිතයේ සමහර අවස්ථාවල දී දේව සබඳතා ඇති අයගේ හෝ වෙනත් අයගේ බයිබලයේ උපකාර අවවාද අවශ්‍යයි. හුඟක් වෙලාවල දී ජීවිතයේ වැටීම්වල දී මොනවා කරන්න ද කියලා පේන්නේ නැති කොට .......... ඒ අවශ්‍යතාවය හුඟක් දැනෙනවා.

## III ජවනිකාව

( යුදස්ගේ කුඩා නිවස දිස් වේ. එය දිළිඳු නිවසක සිරිය උසුලයි. පුටු දෙකක් හා මේසයක් ඇත.)

හඬ : "අනනියස්"

අනනියස් : " ස්වාමීනී මම මෙහි ය."

හඬ : නැගිටින්න. ගොස් සාවුල් නම් කෙනෙක් ගැන ජුදස්ගෙන් විමසන්න. තමාට පෙනීම ලැබීමට අනනියස් නම් මිනිසකු තමා පිට අත තබනු ඔහුට දර්ශනය වී ඇත.

අනනියස් : ඒත් ඔහු ජෙරුසලමේ ක්‍රිස්තු පිළිගන්නන්ට පීඩා කළා. දමස්කයට ආවෙත් ක්‍රිස්තු පිළිගන්නන් අත්අඩංගුවට ගන්න.

හඬ : "යන්න මන්ද ඔහු මාගේ නාමය විජාතීන් ද රජුන් ද ඊශ්‍රායෙල් පුත්‍රයන් ද වෙත ගෙන යෑමට මා විසින් තෝරා ගත් භාජනයකි. ඔහුමාගේ නාමය නිසා කොපමණ දුක් විඳින්නට ඕනෑ ද කියා ඔහුට දන්වන්නෙමි."

3 පුද්ගලයා : අන්න...... ක්‍රිස්තුස් ඔහු කැඳවනවා තම සේවයට. හරි පුදුමයි පීඩා කළ තැනැත්තා ව ම සේවයට තෝරාගෙන.

## IV ජවනිකාව

(අනනියස්ගේ කුඩා නිවස නැවත පසුබිමේ දිස් වේ. එහි සාවුල් යාච්ඤා කරමින් සිටියි.)

1 පුද්ගලයා : ඔහු දින තුනක් ම නිරාහාර ව ඔහොම ඉන්නවා මම දැක්කා.

2 පුද්ගලයා : ඔහු නිහඬ ව භාවනාවෙන් යටහත් පහත් ව සූදානම් වෙනවා. ඔව් කල්පනා කරලා තමයි තීරණ ගන්නේ ඒකට කාලය අවශ්‍යයි.

1 පුද්ගලයා : අන්න........ කවුද එනවා ........
ඒ අර අනනියස් නේද?

2 පුද්ගලයා : අන්න සුවය ලැබෙන්න යාච්ඤා කරනවා.

අනනියස් : "සහෝදර සාවුල් ඔබට පෙනීම ලබන පිණිසත් ඔබ ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ කරනු ලබන පිණිසත් දෙවියන් වහන්සේ එනම් ඔබ ගමන් කළ මාර්ගයේ දී ඔබට දර්ශනය වූ ජේසුස් වහන්සේ මා එවූ සේක."

1 පුද්ගලයා : අන්න ඇස්වලින් කොරපොතු වගේ දෙයක් වැටෙනවා. අන්න ඔහු නැගිට්ටා.

2 පුද්ගලයා : ( බලමින් ) ඔහු ව බව්තීස්ම කරනවා නේද?.

1 පුද්ගලයා : ඔව්, අන්න කෑම කනවා.

2 පුද්ගලයා : ඔව්, ජනතාව වෙනුවෙන් වැඩ කරන්න ආත්මික හා ශාරීරික ආහාර දැන් ඔහුට වැටුණනේ.


### දමස්කයට යන ගමනේ අත්දැකීමෙන් පසු පාවුලගේ චින්තනයේ අඛණ්ඩ වෙනසක් සිදු වූ බව පෙනේ ..........

සාවුල් ටික කලක් ගෝලයන් සමග නැවතී අධ්‍යාපනය ලැබී ය. කිහිප දවසකින් වැඩ ආරම්භ කළ ඔහු තම අත්දැකීම තුළින් උන්වහන්සේ දෙවියන් වහන්සේ ගේ පුත්‍රයා ම බව ප්‍රකාශ කළේ ය. ඒ ලබ්ධි මාර්ගයට අයත් වූවන් වැනසූ තැනැත්තා ම ජේසුස් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ බව ඔප්පු කරමින් අනෙක් අය නිරුත්තර කළේ ය.

එහෙත් සාවුල් ගෝලයන්ට එක්වන්නට උත්සාහ ගනිද්දී ඔවුහු සාවුල් විශ්වාස නොකර, ඔහුට බිය වූහ. බාර්ණබස් ඔහු අත අල්ලාගෙන ඔහු ගැන සාක්ෂි දරමින් ප්‍රේරිතයන් දැනුවත් කළේ ය.

මෙසේ මරණ තර්ජනවලට පවා මුහුණ දුන් සභාවට සාමයේ කාලයක් (ක්‍රියා 9 : 31 ) ඇති විය. මෙසේ වෙනස් වූ සාවුල් ලිපි ලියමින් ද දේශනා කරමින් ද ක්‍රිස්තුස් වහන්සේ ගැන සාක්ෂි දැරූ අන්දම ඉදිරි පාඩම්වලින් දැකිය හැකි ය.

ඹටඑහ ඩඑ;ඍද ද,හඳ




අන්‍යභක්තිකයන් විසින් කිතුබැතියන් හැඳින්වූයේ "ක්‍රිස්තියානි" යන නමිනි. එහි මූලික අර්ථය " ක්‍රිස්තුස් වහන්සේ අනුගමනය කරන්නා" යනුයි. (ක්‍රියා 1 : 26 / 26 : 28 / 1 පේදුරු 4 : 16 )

❖ **ඇගැයීම :-**

1. අද අප ක්‍රියාකරන්නේ පාවුල්ගේ හැරීමට පෙර පාවුල්ගේ හැරීමට පසු ක්‍රියාකාරීත්වය ය. එසේ අපගේ ජීවිත තුළ ක්‍රියා කරන එම අවස්ථා වගු ගත කරන්න.